# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## 2020 විෂය නිර්දේශය

## නියාමක ප්‍රශ්න පත්‍රය

# අදියර I

# 103 - ආර්ථික විද්‍යාව (ECN)

අධ්‍යාපන සහ පුහුණුකිරීම් අංශයේ ප්‍රකාශනයකි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය
# 103 - ආර්ථික විද්‍යාව (ECN)
# නියාමක ප්‍රශ්න පත්‍රය

**අයදුම්කරුවන්ට උපදෙස් (කරුණාකර අවධානයෙන් කියවන්න) :**

**දෙනු ලබන කාලයඃ**

- ලිවීම සඳහා පැය 03 යි.

**ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහයඃ-**

- A කොටස, B කොටස සහ C කොටස ලෙස කොටස් 3 කින් මෙම ප්‍රශ්න පත්‍රය සමන්විතය.
- සියළුම ප්‍රශ්නවලට උත්තර ලිවිය යුතුයග

**ලකුණුඃ**

- එක් එක් කොටස සඳහා ලකුණු :

| කොටස | ලකුණු |
|---|---|
| A | 40 |
| B | 40 |
| C | 20 |
| **එකතුව** | **100** |

- එක් එක් ප්‍රශ්නය සඳහා ලකුණු පෙන්වා ඇත. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා සමත්වීමේ ලකුණු 50% කි.

**උත්තරඃ**

- සියළුම උත්තර,සපයනු ලබන උත්තර පොත්වල ලිවිය යුතුය. ප්‍රශ්නපත්‍රවල ලියනු ලබන උත්තර ලකුණු දීම් සඳහා ඇගයීමට ලක් නොකරනු ඇත.
- එක් එක් ප්‍රශ්නය සඳහා ඔබේ උත්තරය අළුත් පිටුවකින් ආරම්භ කරන්න.
- සියලුම පෙර වැඩ පැහැදිලිව පෙන්නුම් කළ යුතුය.
- තීරුවල උත්තර නොලිවිය යුතුය.

**උත්තර පොත්ඃ**

- එක් එක් උත්තර පොතේ මුල් පිටුවේ උපදෙස් පෙන්වා ඇත.

**ගණකයන්ත්‍රඃ**

- සංකේත වීජගණිතමය හා අවකලනය සඳහා පහසුකම් සලසා ඇති ඒවා හැර ඕනෑම ගණක යන්ත්‍රයක් අයදුම්කරුවන්ට භාවිත කිරීමට අවකාශය ඇත. වැඩසටහන් කළ හැකි ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.

**ඇමුණුම්ඃ-**

- කළයුතු ක්‍රියා පරීක්‍ෂා ලැයිස්තුව. එක් එක් ප්‍රශ්නය (වාස්තවික පරීක්‍ෂා ප්‍රශ්න හැර) කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළයුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ දී ඇති නිර්වචනය මත පදනම්ව අයදුම්කරුවන් විසින් උත්තර සැපයිය යුතුය.

**වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)**
අනිවාර්ය ප්‍රශ්න විස්සකි(20).
(මුළු ලකුණු 40)

**A කොටස**

## *01 වන ප්‍රශ්නය*

**පහත 1.1 සිට 1.10 දක්වා ප්‍රශ්නවලට අදාල වඩාත්ම නිවැරදි පිළිතුර තෝරන්න.**

1.1 පහත සඳහන් ප්‍රකාශ අතරින්, සම්පත් හිඟකම පිළිබඳව විස්තර කරන ප්‍රකාශය තෝරන්න.

(1) වෙළඳපල තුළ ඉල්ලුම හා සැපයුම පවතින විට මෙය පවතී.
(2) සංවර්ධනය වෙමින් පවතින රටවල පමණක් මෙය පවතී.
(3) මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරා ගැනීමට පවතිනා සම්පත් ප්‍රමාණවත් නොවන විට මෙය පවතී.
(4) සම්පත් නිසි ආකාරව බෙදා ගැනිම සිදුනොවන විට මෙය පවතී.

1.2 ආර්ථිකයක නිෂ්පාදන හැකියා මායිම පහත සඳහන් රූපසටහනෙන් පෙන්නුම් කෙරේ.




ඉහත රූපසටහනට අනුව X ලක්ෂයයෙන් පෙන්නුම් කරන්නේ :

(1) පූර්ණ සේවා නියුක්තියයි. (2) ඌණ සේවා නියුක්තියයි.

(2) ආර්ථික පරිහානියයි. (4) ආර්ථික වර්ධනයයි.

1.3 හීනවන ආන්තික උපයෝගීතා නීතිය යන්නෙන් සඳහන් කරන්නේ:

(1) කිසියම් භාණ්ඩයකින් පරිභෝජනය කරනු ලබන ප්‍රමාණය ක්‍රම ක්‍රමයෙන් වැඩි කරන විට අමතර එක් ඒකකයකින් ලබාගන්නා තෘප්තිය අඩු වන බවයි.
(2) වැඩි වැඩියෙන් භාණ්ඩ පරිභෝජනය කරන විට මුළු තෘප්තිය අඩු වන බවයි.
(3) වැඩි වැඩියෙන් භාණ්ඩ නිෂ්පාදනය කරන විට මිල පහළ යාමයි.
(4) වැඩි වැඩියෙන් භාණ්ඩ නිෂ්පාදනය කරන විට මුළු තෘප්තිය වැඩි වීමයි.

1.4 තරඟකාරී වෙළඳපළක අලෙවිවන කිසියම් භාණ්ඩයක් සම්බන්ධයෙන් ඉල්ලුම් හා සැපයුම් වක්‍රවලට අදාල සමීකරණ පහත පරිදි වේ.

$Q_D = 150-10P$ $Q_S = -50+10P$

වෙළඳපොල සමතුලිත අවස්ථාවේදී මිල ඉල්ලුම් නම්‍යතාවය වනුයේ:

(1) -1.0 (2) -0.8 (3) -1.8 (4) -2.0

1.5 පහත සඳහන් හේතු අතුරින්,භාණ්ඩයක ඉල්ලුම් වක්‍රය වමට විතැන් වීමට බලපානු ලබන්නේ කුමක්ද?

(1) සලකා බලන භාණ්ඩයේ මිල අඩු වීමයි.
(2) සලකා බලන භාණ්ඩයේ මිල වැඩි වීමයි.
(3) පාරිභෝගික ආදායම වැඩි වීමයි.
(4) පාරිභෝගික ආදායම අඩු වීමයි.

1.6 කිසියම් ආර්ථිකයකට අදාල ජාතික ගිණුම්කරණය හා සම්බන්ධ පහත තොරතුරු ඔබ වෙත සපයා ඇත.

| | රු(මිලියන) |
|---|---|
| පෞද්ගලික පරිභෝජනය | 24,000 |
| දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය | 36,000 |
| රාජ්‍ය අංශයේ පරිභෝජනය | 14,000 |
| තොග වෙනස්වීම් | 2,500 |
| නිෂ්පාදිතය මත ශුද්ධ බදු | 5,000 |
| ශුද්ධ අපනයනය | -4000 |

මෙම ආර්ථිකයේ වෙළඳ මිලට දළ දේශීය වියදම (රු මිලියන) වනුයේ:

(1) 70,000. (2) 74,000. (3) 79,000. (4) 76,500.

1.7 පටු මුදල් සැපයුම සහ වාණිජ බැංකුවල ඇති මහජනයා සතු ඉතිරි කිරීම් සහ කාලීන තැන්පතුවල එකතුව හඳුන්වනු ලබන්නේ :
(1) මුදල් පදනම ලෙසයි.
(2) පුළුල් මුදල් ගුණකය ලෙසයි.
(3) ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම ලෙසයි.
(4) පුළුල් මුදල් සැපයුම ලෙසයි.

1.8 පහත සඳහන් තොරතුරු ඔබට දී ඇත.

| රට | ශ්‍රම පැයකට ඇඟළුම් | ශ්‍රම පැයකට තේ |
|---|---|---|
| ශ්‍රී ලංකාව | 8 | 20 |
| ඉන්දුනීසියාව | 10 | 15 |

ඉහත දෑ අනුව නිවරදි ප්‍රකාශය තෝරන්න
(1) ශ්‍රී ලංකාවට තේ නිෂ්පාදනය සම්බන්ධයෙන් සාපේක්ෂ වාසියක් පවති.
(2) ශ්‍රී ලංකාව හා ඉන්දුනීසියාව යන රටවල් දෙකටම ඇඟලුම් නිෂ්පාදනය සම්බන්ධයෙන් සාපේක්ෂ වාසි පවති.
(3) ඇඟලුම් නිෂ්පාදනය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවට නිරපේක්ෂ වාසියක් පවති.
(4) තේ නිෂ්පාදනය සම්බන්ධයෙන් ඉන්දුනීසියාවට නිරපේක්ෂ වාසි පවතී.

1.9 පහත සඳහන් ඒවා අතුරින් රටක ගෙවුම් ශේෂ ලේඛණයෙහි මූල්‍ය ගිණුමේ අන්තර්ගත වන්නේ කුමක්ද ?
(1) විදේශ ණය මත පොළී ගෙවීම්
(2) ආයෝජන මත පොළි ලැබීම්
(3) භාණ්ඩ වෙළදාම
(4) සෘජු විදේශ ආයෝජන

1.10 තිරසාර සංවර්ධනය සඳහා 2030 න්‍යාය පත්‍රයේ සියළුම ජාතීන් එකඟ වූ තිරසාර සංවර්ධන අරමුණු කවරක්ද ?

(1) කුසගින්න සහමුලින්ම ඉවත් කිරීම.
(2) දරිද්‍රතාවය තුරන් කිරීම.
(3) ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය.
(4) ඉහත සඳහන් සියල්ලම.

**ප්‍රශ්න අංක 1.11 සිට 1.12 දක්වා ඇති ප්‍රශ්නවලට හිස්තැනට සුදුසු වචනය /වචන වරහන් තුළින් තෝරා ලියන්න.**

1.11 සමාජීය විද්‍යා විෂයක් ලෙස ආර්ථික විද්‍යාව මඟින් මිනිසුන්ගේ................................(පෞද්ගලික හැසිරීම/ආර්ථික හැසිරීම) අධ්‍යයනය කරනු ලබයි.

1.12 කිසියම් භාණ්ඩ යුගලයක් සම්බන්ධයෙන් හරස් මිල ඉල්ලුම් නම්‍යතාවය ධන අගයක් ගනී නම් එම භාණ්ඩ යුගලය................................(අනුපූරක/ආදේශක) භාණ්ඩ වේ.

**ප්‍රශ්න අංක 1.13 සිට 1.14 දක්වා ඇති ප්‍රශ්න වලට අදාල පහත සඳහන් ප්‍රකාශනයන්හි සත්‍යද අසත්‍යද යන්න සඳහන් කරන්න.**

1.13 ආර්ථික පිරිවැය, නිෂ්පාදනයේ සෘජු සහ වක්‍ර යන පිරිවැය දෙකෙන්ම සමන්විත වේ.

1.14 ආන්තික පිරිවැය (MC) වක්‍රය, සාමාන්‍ය පිරිවැය (AC) වක්‍රයේ උපරිම ලක්ෂ්‍යයේදී AC වක්‍රය ඡේදනය කරයි.

**ප්‍රශ්න අංක 115 සිට 1.20 දක්වා ප්‍රශ්නවලට සුදුසු පිළිතුර තෝරන්න.**

1.15 නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය නිර්මාණය කිරීමේදි භාවිතාකරන උපකල්පන හතරක් (04) සඳහන් කරන්න.

1.16 වෙළඳපළ ආර්ථික ක්‍රමයක ලක්ෂණ හතරක් (04) ලැයිස්තුගත කරන්න.

1.17 මිල සහ ඉල්ලුම් ප්‍රමාණය අතර සෘණ සම්බන්ධතාවයක් පැවතීමට හේතු දෙකක් (02) කෙටියෙන් පැහැදිලි කරන්න.

1.18 මිල ඉල්ලුම් නම්‍යතාවයේ තීරක දෙකක් (02) සඳහන් කරන්න.

1.19 පාරිභෝගික අතිරික්තය සහ නිෂ්පාදන අතිරික්තය අතර වෙනස කෙටියෙන් පැහැදිලි කරන්න.

1.20 කිසියම් භාණ්ඩයක් සම්බන්ධ සැපයුම් වක්‍රය දකුනට විතැන්වීමට බලපාන හේතු දෙකක් (02) සඳහන් කරන්න.

***(02 බැගින් මුළු ලකුණු 40)***

## *A කොටසේ අවසානය*

**අනිවාර්ය ප්‍රශ්න 04කි.**

(මුළු ලකුණු 40)

**B කොටස**

*02 වන ප්‍රශ්නය*

**(a)**

i. ආර්ථිකයක ආර්ථික සම්පත් යන්න **පැහැදිලි කරන්න.** (ලකුණු 02)

ii. ශ්‍රී ලංකාව කුමන වර්ගයේ ආර්ථිකය පද්ධතියකට අයත්වන්නේ දැයි හඳුනාගෙන එම හඳුනාගැනීම සඳහා හේතු **පැහැදිලි කරන්න** (ලකුණු 03)

**(b)** X භාණ්ඩය සම්බන්ධයෙන් ඉල්ලුම් හා සැපයුම් සමීකරණ පහත පරිදි වේ.

$Q_D = 300 – 5p$ $Q_S = -50 + 5p$

වෙළඳපොල සමතුලිත මිල සහ ප්‍රමාණය **ගණනය කරන්න.** *(ලකුණු 03)*

**(c)** X භාණ්ඩය සඳහා රජය රුපියල් 40 ක අවම මිලක් පැනවීමට තීරණය කළේ යැයි සිතන්න.

වෙළඳපොලේ අවම මිල පැනවීමේ ප්‍රතිඵලයක් ලෙස නිෂ්පාදකයින් විසින් කොපමණ භාණ්ඩ ප්‍රමාණයක් සපයනු ලැබේදැයි **පැහැදිලි කරන්න**

*(ලකුණු 02)*

*(මුළු ලකුණු 10)*

*03 වන ප්‍රශ්නය*

**(a)** කෙටිකාලයේදි ආයතනයක නිෂ්පාදන ක්‍රියාවලියේ හැසීරිම **පැහැදිලි කරන්න.**

(ලකුණු 03)

**(b)** පූර්ණ තරඟකාරී ආයතනයක දිගුකාලීන සමතුලිතය ප්‍රස්ථාරයක් භාවිතයෙන් **පැහැදිලි කරන්න.** *(ලකුණු 04)*

**(c)** පූර්ණ තරඟකාරී වෙළඳපොලක හා ඒකකාරී වෙළඳපොලක අතර වෙනස්කම් තුනක් (03) **පැහැදිලි කරන්න.**

*(ලකුණු 03)*

(මුළු ලකුණු 10)

## *04 වන ප්‍රශ්නය*

**(a)** ගණුදෙනු චේතනාවෙන් මුදලට කරන ඉල්ලුම සහ සමපේක්ෂණ චේතනාවෙන් මුදලට කරන ඉල්ලුම අතර වෙනස්කම් **පැහැදිලි කරන්න.**

(ලකුණු 04)

**(b)** "මුදල්, වෙළඳපොල තුළ සුවිශේෂ කාර්යභාරයක් ඉටු කරයි."

මෙම ප්‍රකාශයේ වලංගුබව සනාථ කිරීම සඳහා හේතු තුනක් (03) **පැහැදිලි කරන්න.**

(ලකුණු 03)

**(c)** ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනය සහ පිරිවැයෙන් තල්ලු වූ උද්ධමනය අතර වෙනස **පැහැදිලි කරන්න.**

(ලකුණු 03)

( මුළු ලකුණු 10)

## *05 වන ප්‍රශ්නය*

**(a)**

i) ව්‍යාපාර චක්‍රය යනු කුමක් දැයි **පැහැදිලි කරන්න** (ලකුණු 02)

ii) ව්‍යාපාර චක්‍රයක අදියර දෙකක් (02) **පැහැදිලි කරන්න.** (ලකුණු 02)

**(b)** නිරපේක්ෂ වාසි න්‍යාය සහ සාපේක්ෂ වාසි න්‍යාය අතර වෙනස **පැහැදිලි කරන්න.** (ලකුණු 02)

**(c)** එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීමේ ප්‍රතිවිපාක **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## *B කොටසේ අවසානය*

**අනිවාර්ය ප්‍රශ්නයකි.**

**C කොටස**

**(ලකුණු 25)**

*06 වන ප්‍රශ්නය*

**(a)** (i) වෙළඳපොල බිඳවැටීම යනු කුමක්දැයි **පැහැදිලි කරන්න.**

(ලකුණු 01)

(ii) වෙළඳපොළ බිඳවැටීමට බලපාන හේතුන් තුනක් (03) **සඳහන් කරන්න.**

(ලකුණු 03)

**(b)** රටක සාර්ව ආර්ථික අරමුණු හතරක් (04) **පැහැදිලි කරන්න.**

(ලකුණු 04)

**(c)** කල්පිත ආර්ථිකයක් සම්බන්ධයෙන් පහත සඳහන් දත්ත ඔබ වෙත සපයා ඇත.

| අයිතමය | පටිනාකම (රුපියල් බිලියන) |
|---|---|
| සේවක ආදායම් | 4,500 |
| දළ මෙහෙයුම් අතිරික්තය | 8,200 |
| ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය | 700 |
| නිෂ්පාදන මත සහනාධාර අඩු කල පසු අනෙකුත් බදු | 100 |
| නිෂ්පාදන මත ශුද්ධ බදු | 1,200 |
| විදේශ රටවලින් ලැබුණු ශුද්ධ ප්‍රාථමික ආදායම | -800 |

**පහත සඳහන් දෑ ගණනය කරන්න.**

(i) මූලික මිලට දළ එකතු කළ අගය *(ලකුණු 02)*

(ii) වෙළඳපොල මිලට දළ දේශිය නිෂ්පාදිතය (ලකුණු 02)

(iii) දළ ජාතික ආදායම *(ලකුණු 02)*

**(d)** වානිජ බැංකුවල ද්‍රවශීලතාවය සහ ලාභදායකත්වය අතර පවත්නා සම්බන්ධතාවය **පැහැදිලි කරන්න.**

(ලකුණු 03)

**(e)** ගෝලීය ආර්ථිකයේ නව ප්‍රවණතා තුනක් (03) **හඳුනා දක්වන්න.**

(ලකුණු 03)

(මුළු ලකුණු 20)

***C කොටසේ අවසානය***

# කළයුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| **විශ්ලේෂණය (4)** | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම | විශ්ලේෂණය කරන්න | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න |
| | | වෙනස් කොට දක්වන්න | යමක් තවෙකකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම |
| | | විමසන්න | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම |
| | | සමානකම් බලන්න | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම |
| | | අසමානතා බලන්න | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම |
| | | සැකිල්ලක් සේ දක්වන්න | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම |
| | | සන්නිවේදනය කරන්න | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම |
| **භාවිතය (3)** | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිතකර ගැළපීම | භාවිත කරන්න | ප්‍රායෝගිකව භාවිතයේ යෙදෙන්න |
| | | ගණනය කරන්න | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම |
| | | ප්‍රදර්ශනය කරන්න | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම |
| | | පිළියෙළ කරන්න | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම |
| | | විසඳන්න | ගණනය කිරීම හා හෝ පැහැදිලි කිරීම හරහා විසඳුම් සෙවීම |
| | | තක්සේරු කරන්න | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මකබව තීරණය කරන්න |
| | | ප්‍රස්ථාර දක්වන්න | ප්‍රස්ථාර මගින් නියෝජනය කරන්න |
| | | සසඳන්න | තවත් එකක් සමග අනුගත/අනුරූප කරන්න |
| **අවබෝධය (2)** | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම | නිර්වචනය කරන්න | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම |
| | | පැහැදිලි කරන්න | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම |
| | | විස්තර කරන්න | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න |
| | | අර්ථකථනය කරන්න | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න |
| | | හඳුනා ගන්න | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම |
| **දැනුම (1)** | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | ලැයිස්තුගත කරන්න | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම |
| | | හඳුනා දක්වන්න | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම |
| | | සඳහන් කරන්න | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම |
| | | සම්බන්ධ කරන්න | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම |
| | | අඳින්න | හැඩයක් හෝ රූප සටහනක් ගෙනහැර දැක්වීම |

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## 2020 විෂය නිර්දේශය

## ආදර්ශ විසඳුම්

# අදියර I

## 103 - ආර්ථික විද්‍යාව (ECN)

අධ්‍යාපන සහ පුහුණුකිරීම් අංශයේ ප්‍රකාශනයකි.

**වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)**
අනිවාර්ය ප්‍රශ්න විස්සකි
මුළු ලකුණු 25

**A කොටස**

**01 වන ප්‍රශ්නය සඳහා යෝජිත පිළිතුරු**

1.1 (03)
1.2 (02)
1.3 (01)
1.4 (04)
1.5 (04)
1.6 (02)
1.7 (04)
1.8 (01)
1.9 (04)
1.10 (04)
1.11 ආර්ථික හැසිරීම.
1.12 ආදේශන භාණ්ඩ
1.13 සත්‍ය වේ
1.14 අසත්‍ය වේ

1.15
- සම්පත්වල පූර්ණ සේවානියුක්ත බව
- උපරිම තාක්ෂණය භාවිතා කරන බව හා එම තාක්ෂණය නොවෙනස්ව පවතින බව
- භාණ්ඩ වර්ග දෙකක් පමණක් නිෂ්පාදනය කරන බව
- යම් නිශ්චිත කාලයකට අදාල වන බව

1.16
- සම්පත් හිමිකාරීත්වය ඍජු සහ වක්‍රව පෞද්ගලික අංශය සතු වේ.
- පාරිභෝගිකයන්ට නිදහසක් තිබේ.
- නිෂ්පාදකයින්ට නිදහසක් තිබේ.
- රාජ්‍ය මැදිහත් වීම සීමිතවීම
- වෙළඳපොල බලවේග මඟින් භාණ්ඩවල මිල තීරණය වීම (මිල යාන්ත්‍රණයේ ක්‍රියාකාරීත්වය)
- ලාභය තුලින් පෞද්ගලික අංශය අභිප්‍රේරණය වේ.

1.17 ආදේශන ප්‍රතිවිපාකය

සලකා බලන භාණ්ඩයේ මිල එයට සම්බන්ධ ආදේශන භාණ්ඩවලට වඩා අඩු වනවිට එය වෙළඳපොලේ ලාභදායක වේ. පුද්ගලයෙකු සලකා බලන භාණ්ඩයෙන් සාමාන්‍යයෙන් වැඩිපුර මිලදී ගනී. මෙය ආදේශන ප්‍රතිවිපාකය වේ. උදාහරණ කෝපිවල මිල නොවෙනස්ව තිබියදී තේවල මිල අඩු වනවිට කෝපිවලට වඩා තේ ඉල්ලුම් කෙරේ.

ආදායම් ප්‍රතිවිපාකය

සලකා බලන භාණ්ඩයේ මිල වෙනස් වනවිට පාරිභෝගිකයන්ගේ මූර්ත ආදායම වෙනස් වේ. එමනිසා ආදායමෙන් මිලදි ගත හැකි භාණ්ඩ හේතු කොටගෙන මූර්ත ආදායමේ ඇතිවන වෙනස් වීම මත සලකා බලන භාණ්ඩයේ ඉල්ලුම ප්‍රමාණය වෙනස් වේ. මෙය ආදායම් ප්‍රතිවිපාකය වේ. උදාහරණ සලකා බලන භාණ්ඩයේ මිල අඩු වනවිට පුද්ගලයෙකුගේ මිලදී ගැනීමේ හැකියාව වැඩි වේ.

1.18

- ආදේශකභාණ්ඩ වල සුලභතාවය
- භාණ්ඩයේ ස්වරූපය
- පාරිභෝගික ආදායමෙන් වැයකරන ප්‍රමාණය
- මිල වෙනස් වීම හේතුවෙන් එයට හැඩ ගැසීමට ගතවන කාලය.
- භාණ්ඩයට ඇති විකල්ප සංඛ්‍යාව

1.19

වෙළඳපොල හුවමාරු කරනු ලබන සමතුලිත භාණ්ඩ ප්‍රමාණය සඳහා පාරිභෝගිකයන් ගෙවීමට කැමති මිලත් සත්‍ය වශයෙන්ම ගෙවන මිලත් අතර වෙනස පාරිභෝගික අතිරික්තය වේ.
සැපයුම්කරුවෙකු භාණ්ඩයක් සඳහා අපේක්ෂා කරන අවම මිලක් වෙළඳ පොලේ දි සත්‍ය වශයෙන්ම ලැබෙන මිලත් අතර වෙනස නිෂ්පාදන අතිරික්තය ලෙස හැඳින්වේ.




1.20

- සම්බන්ධිත භාණ්ඩවල මිල පහල යාම
- නිෂ්පාදනයට යොදා ගන්නා යෙදවුම්වල මිල පහළ යාම
- රජය නිෂ්පාදකයින්ගෙන් අයකරන බදු කපා හැරීම.
- රජය නිෂ්පාදකයාට සහනාධාර ලබාදීම
- සලකා බලන භාණ්ඩයේ අනාගත මිල අඩුවෙතැයි අපේක්ෂා කිරීම.

***(ලකුණු 02 බැගින් මුළු ලකුණු 40)***

## ***A කොටසේ අවසානය***

**අනිවාර්ය ප්‍රශ්න 04 කි**

මුළු ලකුණු 40)

**B කොටස**

**2 ප්‍රශ්නය සඳහා යෝජිත පිළිතුරු**

**ඒකකය 1 - ව්‍යාපාර පරිසරය සඳහා ආර්ථික සංකල්ප හා ආර්ථික පද්ධති**
**ඒකකය 2** - ඉල්ලුම, සැපයුම, සමතුලිතය හා රජයේ මැදිහත් වීම.

ඉගෙනුම් ප්‍රතිඵල - ආර්ථික සම්පත් හා ආර්ථික නොවන සම්පත් පැහැදිලි කිරීම

- විවිධ ආර්ථික පද්ධති පැහැදිලි කිරීම.

- ඉල්ලුම් හා සැපයුම් න්‍යාය විශ්ලේෂණය කිරීම

(a)

(i) <u>භූමිය</u>

නිෂ්පාදන ක්‍රියාවලියට භාවිතාකළ හැකි ස්වභාවධර්මයේ දායාදයක් ලෙස ලැබි ඇති දෑ භූමිය ලෙස හැඳින්වේ. භූමිය සඳහා කරන ගෙවීම බදුකුලිය වේ.
උදාඃ- ගංගා,ඛණිජ සම්පත්

<u>ශ්‍රමය</u>

නිෂ්පාදන ක්‍රියාවලියට භාවිතා කරනු ලබන මිනිසුන් සතු කායික හා මානසික හැකියාව වේ. ශ්‍රමය සඳහා කරන ගෙවීම් වැටුප්ය.

<u>ප්‍රාග්ධනය</u>

නිෂ්පාදන ක්‍රියාවලියට යොදාගනු ලබන මිනිසා විසින් නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදන ආධාරක තොගය ප්‍රාග්ධනය ලෙස හැඳින්වේ. යන්ත්‍ර සූත්‍ර,යන්ත්‍රාගාර,කර්මාන්ත ශාලා ප්‍රාග්ධනය සඳහා උදාහරණයයි. ප්‍රාග්ධනය සඳහා කරන ගෙවීම පොළිය වේ.

<u>ව්‍යවසායකත්වය</u>

ව්‍යවසායකත්වය යනු නිර්මාණශීලීත්වය සහිත ශ්‍රමයෙහි සුවිශේෂ කොටසයි. යම් නිෂ්පාදන ක්‍රියාවක් සම්බන්ධව නිෂ්පාදන තීරණ ගනිමින් මූලික ආර්ථික ප්‍රශ්න විසඳාලමින් වෙළඳපොල අවදානම් දරමින් නිෂ්පාදන ක්‍රියාවලිය සංවිධානය කොට පවත්වාගෙන යාම ව්‍යවසායකත්වය ලෙස හැඳින්වේ. ව්‍යවසායකත්වයෙ මිල ලාභය වේ.

**(ලකුණු 02)**

(ii) ශ්‍රී ලංකාවේ ආර්ථික පද්ධතිය මිශ්‍ර ආර්ථිකයකි. එය වෙළඳපොල ආර්ථික පද්ධතියක ලක්ෂණ මෙන්ම සමාජවාදී ආර්ථිකයක ලක්ෂණද දැකගත හැකිය.පෞද්ලික අංශය ආර්ථිකය තුල ක්‍රියාත්මක වන අතරම රාජ්‍ය අංශයද අධ්‍යාපනය ගෙවීම් ආදී සේවාවන් සපයනු ලබයි.

**(ලකුණු 03)**

**(b)** (i)

$Q_a = 300-5p$

$Qs = -50+5p$

වෙළඳ පොල සමතුලිතය

$Qd = Qs$

$300-sp = -50+sp$

$-5P-5P = -50-300$

$-10P = -350$

$\frac{-10P}{-10} \quad \frac{-350}{-10} = P = 35$

$Qd = 300\ sp$

$P = 35$ නිසා

$Qd = 300-5\times35$

$Q = 300-175$

$Q = 125$

(ලකුණු 03)

C) මිල රු 40 වන විට සැපයුම් ප්‍රමාණය

$Q_S = -50 + 5\ (40)$

$Q = -50+200$

$Q = 150$ **(ලකුණු 02)**

***(මුළු ලකුණු 10)***

**3 ප්‍රශ්නය සඳහා යෝජිත පිළිතුරු**

| | |
|---|---|
| **3 ඒකකය** | **– නිශ්පාදන ක්‍රියාවලියෙහි හැසිරීම හා විවිධ වෙළඳපල ව්‍යුහ.** |
| ඉගෙනුම් ප්‍රතිඵල | – නිශ්පාදන ක්‍රියාවලියක් තුළ නිෂ්පාදන පිරිවැයවල හැසිරීම පැහැදිලි කිරීම.<br>- විවිධ වෙළඳපොල ව්‍යුහ හා ඒවායේ ලක්ෂණ විමසීම |

**(a)**

කෙටි කාලින නිෂ්පාදන ක්‍රියාවලියකදි, හීනවන ආන්තික ඵලදා න්‍යාය මගින් කෙටි කාලය නිමවුමේ හැසිරීම නිශ්චය කරයි. නිෂ්පාදනයේ ස්ථාවර යෙදවුමයක සංයෝගයක් සමග විචල්‍ය යෙදවුම් ප්‍රමාණය භාවිතා කරන්නේ නම් ආන්තික නිෂ්පාදිතය සහ සාමාන්‍ය නිෂ්පාදිතය අවසානයේ අඩු වේ. කෙටි කාලින නිෂ්පාදන ක්‍රියාවලියකදි ස්ථාවර යෙදවුම් නොවෙනස්ව තබා ගනිමින් විචල්‍ය යෙදවුම් වෙනස් කිරිම මගින් නිෂ්පාදනය වැඩි කරයි.

**(ලකුණු 03)**

**(b)** දිගු කාලයක් තුළදී පූර්ණ තරගකාරී වෙළඳපොලට අලුතින් ආයතන ඇතුලත් වේ. පූර්ණ තරගකාරී ආයතනයක සමතුලිතයේදී ආන්තික පිරිවැය වක්‍රය සහ සාමාන්‍ය පිරිවැය වක්‍රයේ අවම ලක්ෂයේදී ඉල්ලුම් වක්‍රය (මිල) ඡේදනය කරයි.




(ලකුණු 04)

**(c)**

| | පූර්ණ තරඟකාරී වෙළඳ පොල | ඒකාධිකාරී වෙළඳ පොල |
|---|---|---|
| 1 | සැපයුම්කරුවන් ප්‍රමාණය අතිවිශාල වීම | එක් සැපයුම්කරුවෙකු පමණක් සිටීම |
| 2 | නිෂ්පාදනය සමජාතිය වීම | නිස්පාදනය සුවිශේෂී එකක් වීම |
| 3 | ආබාධ ප්‍රවේශය හා පිටවීම | ප්‍රවේශය හා පිටවීම බාධාකාරී වීම |
| 4 | ආයතන මිල ගන්නෙකු වීම | ආයතනය මිල සකසන්නෙකු වීම |
| 5 | වෙළඳපොලේ ආයතන පූර්ණ නම්‍ය ඉල්ලුම් ව්‍යුහයකට මුහුණ දීම | වෙළඳ පොල තුළ ආයතනයේ පහළට බෑවුම් වූ ඉල්ලුම් වක්‍රයකට මුහුණ දීම |

**(වෙනස්කම් 3කට- ලකුණු 03)**

***(මුළු ලකුණු 10)***

**4 ප්‍රශ්නය සඳහා යෝජිත පිළිතුරු**

**4 වන ඒකකය - ජාතික ගිණුම්කරණය හා රජයේ කාර්යභාරය**
**5 වන ඒකකය - ජාත්‍යන්තර වෙළඳාම හා විනිමය වෙළඳපොල**
ඉගෙනුම්ඵල - ව්‍යාපාර චක්‍රය හඳුනාගැනීම හා ව්‍යාපාර කෙරෙහි එහි බලපෑම පැහැදිලි කිරීම.
- ජාත්‍යන්තර වෙළඳ න්‍යායන් පැහැදිලි කිරීම.
- විනිමය වෙළඳ පොල පැහැදිලි කිරීම සහ විනිමය අනුපාතය තීරණය කරන සාධක හඳුනා ගැනීම

**(a)**

1) විනිමය මාධ්‍යයක් ලෙස මුදලේ කාර්යය සම්බන්ධ වීම ගනුදෙනු චේතනාවෙන් මුදලට කරන ඉල්ලුමයි. වත්කම් ගබඩාකර තැබීම ලෙස මුදලේ කාර්යය සම්බන්ධ වීම සම්පේක්ෂණ චේතනාවෙන් මුදලට කරන ඉල්ලුමයි.

2) කුටුම්භ සහ ව්‍යාපාර ආයතන වල ලැබීම් හා ගෙවීම් අතර වෙනසක් පවතින බැවින් එදිනෙදා ගනුදෙනු කිරීමේ අරමුණින් මුදල් ශේෂ ළංකර ගැනීම ගනුදෙනු චේතනාවෙන් මුදලට කරන ඉල්ලුමයි. මුදල් ශේෂ ළංකර ගැනීම ආවස්ථික පිරිවැය සහිත කාර්යයකි. අනාගතයේ වාසි ලබා ගැනීමේ අරමුණින් වර්ථමානයේ මුදල් ශේෂ ලග තබා ගැනීම සම්පේක්ෂණ චේතනාවෙන් මුදලට කරන ඉල්ලුමයි. එනම් බිල්පත්‍රවල ආයෝජනය කරන අරමුණින් මුදල් ශේෂ ලගාකර ගැනීම සම්පේක්ෂණ චේතනාවෙන් මුදල් ඉල්ලුමයි.

3) ගනුදෙනු චේතනාවෙන් මුදලට කරන ඉල්ලුම ආදායම මත තීරණය වන අතර සමපේක්ෂණ චේතනාවෙන් මුදලට කරන ඉල්ලුම පොලී අනුපාතිකය මත තීරණය වේ.

(ලකුණු 04)

**(b)**

<u>විනිමය මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම</u>

මුදලේ වැදගත්ම කාර්යය ගණුදෙනු පහසු කිරීම සඳහා විනිමය මාධ්‍යයක් ලෙස ක්‍රියා කිරීමයි. විනිමය මාධ්‍යයක් ලෙස මුදල් නොතිබුණි නම් සියළුම ගණුදෙනු පොටර් ක්‍රමයේ ආකාරයේ සෘජුව භාණ්ඩවලට භාණ්ඩ හුවමාරු කරගැනීමට සිදුවේ.

<u>වටිනාකමේ සංචිතියක් ලෙස කටයුතු කිරීම</u>

පුද්ගලයින් වර්තමානයේ පරිභෝජනය කැපකර අනාගතයේ වියදම් කිරීමේ අරමුණින් ඉතිරිකරනු ලැබේ. මිලදී ගැනීමේ හැකියාව උද්ධමනය හමුවේ මුදලේ මෙම කාර්යය සීමාවනු ලැබේ.

<u>ගිනුම් ඒකකයක් ලෙස කටයුතු කිරීම</u>

භාණ්ඩ හා සේවාවල වටිනාකම ප්‍රකාශ කිරීම සඳහා පොදු මිනුමක් ලෙස මුදල් භාවිතා කරනු ලැබේ.

<u>විලම්භිත ගෙවුම් මාධ්‍යයක් ලෙස</u>

අනාගතයේ ගෙවීම් පදනම මත වර්තමානයේ භාණ්ඩ හා සේවා පරිභෝජනය කිරීමට මුදල් මගින් පහසුකම් සලසනු ලැබේ. උදා:-කල්බදු පදනම යටතේ මෝටර් රථ පරිභෝජනය කිරීම.

*(ලකුණු 03)*

**(c)** සැපයුමට සාපේක්ෂව ඉල්ලුම වැඩි කිරීම නිසා භාණ්ඩ හා සේවාවල පොදු මිල මට්ටම ඉහළයාම ඉල්ලුමෙන් ඇදුනු උද්ධමනය යන්නේ අදහස් වේ. එනම් සමස්ථ ඉල්ලුමේ අතිරික්තයක් නිසා පොදු මිල මට්ටම ඉහළ යාමයි.

පිරිවැයෙන් තල්ලු වූ උද්ධමනය යනු යෙදවුම් මිල හෙවත් නිෂ්පාදන පිරිවය ඉහළ යෑම නිසා සමාහාර සැපයුම අඩු වීමෙන් භාණ්ඩය හා සේවාවල මිල ඉහළ යාම මගින් පොදු මිල මට්ටමේ ඉහළ යාමයි.මෙය නිෂ්පාදන පිරිවය ඉහළ යෑම නිසා ආයතනවල ලාභය පවත්වා ගැනීමේ අරමුණින් මිල වැඩි කිරීමෙන් හටගනී.

*(ලකුණු 03)*

*(මුළු ලකුණු 10)*

**5 ප්‍රශ්නය සඳහා යෝජිත පිළිතුරු**

**4 වන ඒකකය - ජාතික ගිණුම්කරණය හා රජයේ කාර්යභාරය**
**5 වන ඒකකය - ජාත්‍යන්තර වෙළදාම හා විනිමය වෙළඳපළ**
ඉගෙනුම් ප්‍රතිඵල -ව්‍යාපාර චක්‍රය හඳුනාගැනීම හා ව්‍යාපාර කෙරෙහි එහි බලපෑම පැහැදිලි කිරීම.
- ජාත්‍යන්තර වෙළඳ න්‍යායන් පැහැදිලි කිරීම.
- විනිමය වෙළඳපල පැහැදිලි කිරීම හා විනිමය අනුපාතය ගණනය කරන සාධක හඳුනා ගැනීම.

***(a)***

(i) ආර්ථිකයේ භාණ්ඩ සහ සේවා නිමවුමේ අඩු වැඩි වීමේ චක්‍රිය හැසිරීම ව්‍යාපාර චක්‍රයක් ලෙස හඳුන්වයි.

*(ලකුණු 02)*

(ii) <u>ප්‍රසාරණ අවධිය</u>

ව්‍යාපාර චක්‍රයක පතුලක සිට මුදුනත දක්වා ගමන් කරන අවධිය ප්‍රසාරණ අවධිය වේ. ප්‍රසාරණ අවධිය පසුබැසීමේ අවධියට වඩා දීර්ඝ වේ. මෙය සම්පත් 100% උපයෝජනය වනතුරු අඛණ්ඩව තිබේ.

<u>මුදුන</u>

ව්‍යාපාර චක්‍රයක ඉහළම ලක්ෂ්‍යයයි. මෙම ලක්ෂ්‍යයයේදි නිමවුම උපරිම වේ. මෙහි භාණ්ඩ හා සේවා මිල වැඩි වනු ඇත.

<u>පසුබැසීමේ අවධිය</u>

ව්‍යාපාර චක්‍රයක මුදුනත සිට පතුලට බැසීමේ අවධිය වේ. පසුබැසීමේ අවධිය මෙය ප්‍රසාරණ අවධියෙහි ප්‍රතිවිරුද්ද හැසිරීම වේ. මෙම කාලයේදී සේවා වියුක්තිය ඉහළ යන අතර භාණ්ඩ හා සේවා මිල පහළ යයි.

<u>පහළ</u>

සත්‍ය නිමැවුමේ පහළම අවස්ථාව පහළ වේ.මෙහිදි සෘණ ආර්ථික වර්ධනයක් දැකිය හැකිය.

(b) යම්කිසි රටක් තවත් රටකට සාපේක්ෂව අඩුපිරිවැයකින් හෝ වැඩි ඵලදායීතාවයකින් කිසියම් භාණ්ඩයක් නිෂ්පාදනය කරයි නම් එම රටට අදාල භාණ්ඩය සම්බන්ධයෙන් නිරපේක්ෂ වාසි පවතී.

කිසියම් රටක් තවත් රටකට සාපේක්ෂව අඩු ආවස්ථික පිරිවැයකින් කිසියම් භාණ්ඩයක් නිෂ්පාදනය කරයි නම් එම රටට අදාල භාණ්ඩය නිෂ්පාදනය සම්බන්ධයෙන් සාපේක්ෂ වාසියක් පවතී

*(ලකුණු 02)*

(c)

- රුපියල අවප්‍රමාණය සමග උද්ධමනය හට ගනී. එමගින්;
  - ආනයනවල මිල ඉහළ යාම
  - නිෂ්පාදන පිරිවැය ඉහල යෑම නිසා භාණ්ඩ සහ සේවාවල මිල ගණන් ඉහල යෑම
  - එය මිනිසුන්ගේ ජීවන තත්ත්වය අඩුවීමට බලපානු ලැබේ.
  - එය ගෙවුම් තුලන ලේඛනයේ හිගය වැඩිවීමට හේතු වේ.

- භාණ්ඩ සහ සේවාවල මිල ගණන් ඉහල යෑම නිසා මිලදි ගැනිමේ හැකියාව අඩු වේ.
- ගෙවිය යුතු විදේශිය ණය වාරිකය හා පොළී මුදල ඉහළ යාම. එය ගෙවුම් තුලන ලේඛනයේ හිගය වැඩිවීමට හේතු වේ.
- මූර්ත වැටුප අඩුවීම. භාණ්ඩ සහ සේවාවල මිල ගණන් ඉහල යෑම නිසා සේවකයන්ගේ මූර්ත වැටුප අඩු වේ.
- දිගින් දිගටම රුපියලේ අගය පිරිහීම හේතුවෙන් ආයෝජකයන් ආයෝජනය කිරිමට මැළිකමක් දක්වයි.එය රටෙහි සංවර්ධනයට විශාල බලපෑමක් ඇති කරයි.

*(ලකුණු 04)*

## *B කොටසේ අවසානය*

**අනිවාර්ය ප්‍රශ්න එක (01) කි.**

(මුළු ලකුණු 20)

**C කොටස**

**6 ප්‍රශ්නය සඳහා යෝජිත පිළිතුරු**

**4 වන ඒකකය - ජාතික ගිණුම්කරණය හා රජයේ කාර්යභාරය**
**5 වන ඒකකය - මූල්‍ය පද්ධතිය මුදල් හා පොදු මිල මට්ටම**
**7 වන ඒකකය - ආර්ථික වර්ධනයංවර්ධනය හා ආර්ථිකයේ නව ප්‍රවතා**

ඉගෙනුම් ප්‍රතිඵල - සාර්වආර්ථික අරමුණු ඉටුකර ගැනීම සඳහා රජයේ කාර්යභාරය පැහැදිලි කිරීම.
- සාර්වආර්ථික අරමුණු හඳුනාගැනීම
- ප්‍රධාන ප්‍රවේශ තුන භාවිත කරමින් ජාතික ගිණුම් සකස් කිරීම
- වානිජ බැංකුවල ද්‍රවශීලතාවය සහ ලාභදායීත්වය අතර සම්බන්ධතාවය පැහැදිලි කිරීම.
- ආර්ථිකයේ නව ප්‍රවණතා පැහැදිලි කිරීම.

**(a)**

i) සම්පත් කාර්යක්ෂමව බෙදා හැරීමෙහි ලා වෙළඳපල ක්‍රමය අකාර්යක්ෂම වීම වෙළඳපල බිඳ වැටීම ලෙස හැඳින්වේ.

*(ලකුණු 01)*

ii)

- පොදු භාණ්ඩ හා අර්ධ පොදු භාණ්ඩ නොසැපයීම
- බාහිරතා
- තොරතුරු අපූර්ණ වීම
- සාධක සංචලතාවය අපූර්ණ වීම
- සම්පත් බෙදීයාම අසාධාරණ වීම
- සාර්වආර්ථික අස්ථායීතාවය
- සමහර වෙළඳපොලවල් නොමැති වීම

*(ලකුණු 03)*

(b) <u>මිල ස්ථායීතාවය</u>

උද්ධමනය හෝ අවධමනය පීඩනයකින් තොරව ආර්ථිකය පවත්වාගෙන යෑම මිල ස්ථායීතාවය ලෙස හැඳින්වේ. ආර්ථිකයේ පහළ මට්ටමේ උද්ධමන අනුපාතිකයන් පවත්වාගෙන යනවිට ආර්ථිකයේ මිල ස්ථායීත්වය හටගනි.

<u>පූර්ණ සේවා නියුක්තිය</u>

ආර්ථිකයේ සම්පත් උපරිම කාර්යක්ෂමතාවයකින් පූර්ණ ලෙස නිෂ්පාදනයට භාවිතාකරන විට පූර්ණ සේවා නියුක්තිය හටගනී. ආර්ථිකයකට පූර්ණ සේවා නියුක්තිය ලගාකර ගැනිමට නම් රැකියා අවස්ථා වැඩිකරමින් සේවා විියුක්තිය අවම කළ යුතුය.

<u>ගෙවුම් ශේෂ ස්ථායීතාවය</u>

ගෙවුම් ශේෂ ලේඛනයෙහි හිඟය අවම කිරීම මගින් ගෙවුම් ශේෂ සථායීතාවය ලගාකරගත හැකිය. මේ සඳහා ගෙවුම් ශේෂ ප්‍රශ්නය අවමවන පරිදි විදේශීය රටවල් සමග භාණ්ඩ හුවමාරු කර ගැනීම ආර්ථිකයකට අත්‍යාවශ්‍ය වේ.

සාධාරණත්වය

අදායම් බෙදීයාමේ විෂමතා අවම කිරීම. රටේ ජනතාවගේ අවශ්‍යතා හා වුවමනා සපුරාගත හැකිවන පරිදි සැම පුරවැසියෙකුටම රටේ ආදායම සමසේ බෙදී යාම සාධාරණත්වය ලෙස හැදින්වේ.

තිරසාර සංවර්ධනය

පරිසරයේ ගුණාත්මකභාවය ආර්ක්ෂාවන පරිදි රටක නිෂ්පාදනය පවත්වගෙන යාම තිරසාර සංවර්ධනය ලෙස හැදින්වේ. මෙහිදී නිෂ්පාදන අංශයේ වර්ධනයට අමතරව එහි ප්‍රතිලාභ සැම පුරවැසියෙකුටම බෙදීයාම මෙන්ම පාරිසරික, ආර්ථික සහ සමාජයිය යන අංශ තුනෙහිම වර්ධනයක් බලාපොරොත්තු වේ.

ආර්ථික වර්ධනය-රටක මුර්ථ දළ දේශිය නිෂ්පාදනයේ අඛණ්ඩ ඉහළ යාම ආර්ථික වර්ධනය වේ.

***(අරමුණු 4කට ලකුණු 04)***

©

| | | |
|---|---|---|
| (i) සේවක ආදායම් | 4,500 | |
| දළ මෙහෙයුම් අතිරික්තය | 8,200 | |
| නිෂ්පාදනය මත අනෙකුත් බදු (අඩුකළා සහණාධාර) | 100 | |
| මූලික මුදලට දළ එකතු කළ අගය | **රු. බිලියන 12,800** | |

**(ලකුණු** 02)

ii) දළ දේශිය නිෂ්පාදනය

| | | |
|---|---|---|
| මූලික මිලට දළ එකතුකළ අගය | 12,800 | |
| එකතුකල භාණ්ඩ මත අයකරන ශුද්ධ බදු | 1,200 | |
| වෙළඳ මිලට දළ දේශිය නිෂ්පාදිතය | **රුපියල් බිලියන 14,000** | |

**(ලකුණු** 02)

iii) ශුද්ධ ජාතික ආදායම

| | | |
|---|---|---|
| වෙළඳ මිලට දළ දේශිය නිෂ්පාදිතය | 14,000 | |
| විදේශ රටවවින් ලැබුණු ශුද්ධ ප්‍රාථමික ආදායම | -800 | |
| දළ ජාතික ආදායම | **රු.බි. 13200** | |

**(ලකුණු 02)**

**(d)** වානිජ බැංකු සිය ව්‍යාපාර පවත්වාගෙන යනු ලබන්නේ අරමුදල් රැස්කිරීම මගිනි.මිනිසුන් මුදල් තැන්පත්කරනු ලබන්නේ එම තැන්පතු ඕනෑම අවස්ථාවක ලබා දීමේ හැකියාව හා විශ්වාසය බැංකුව සතු වේ නම් පමණි. එම විශ්වාසය පවත්වා ගැනිම සඳහා වානිජ බැංකු ද්‍රවශීලතාවය ආර්ක්ෂා කරගත යුතුය. අනෙක් අතට බංකු ණය වශයෙන් නිකුත් කරමින් ඔවුන්ගේ ලාභදායීත්වය වර්ධන කරගනී.

**(ලකුණු** 02)

**(e)**

- ඉහල තාක්ෂනය උදා: AI, block chain
- රටවල්වලට බලපාන ස්වභාවික ව්‍යාවසන
- රටවල්වල මූල්‍ය අර්බුධ
- විශේෂයෙන තොරතුරු තාක්ෂණය වැනි කරුණු සම්බන්ධව නව නීතී
- ජපානය ,එංගලන්තය සහ චිනය වැනි රටවල ආර්ථික ක්‍රමයෙන් අඩුවීම
- කොරෝනා වෛරසය හේතුවෙන් සමස්ත ලෝකයේම ආර්ථිකය බිඳවැටීම

**(ලකුණු 02)**

*(මුළු ලකුණු 20)*

***C කොටසේ අවසානය***